තමන්කඩුව ප්‍රාදේශීය සභාව
පොළොන්නරුව දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------------

2018 ජනවාරි 01 සිට 2018 මාර්තු 19 දක්වා කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2019 ජනවාරි 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දිනද දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 16 දිනද පොළොන්නරුව මහා නගර සභාව හා පොළොන්නරුව ප්‍රාදේශීය සභාව වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 මාර්තු 19 දිනට තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ 2018 ජනවාරි 01 දින සිට 2018 මාර්තු 19 දක්වා කාලච්ඡේදය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි අයිතම් 19 ක වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කල යුතුවේ. | ඉදිරියේදී ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් තක්සේරු කර ලේඛනගත කිරීමට කටයුතු කරමි. |
| (ii) | 2016 වර්ෂයේ වෙන්දේසි කරන ලද ඉඩමෙන් ප්‍රාදේශීය සභාව වෙත නීත්‍යානුකූල ඔප්පු මඟින් පවරා දෙන ලද රූඩ් 02 පර්චර් 9.54 ක් වූ බිම් කොටසේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කල යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 12 සහ පෙබරවාරි 19 දින පිළිවෙලින් මිළදී ගත් වානේ අල්මාරි 01 ක සහ පරිගණක මේස 06 ක වටිනාකම වූ රු.51,979 ක් යන්ත්‍ර උපකරණ හා ලී බඩු උපකරණ යන වර්ග දෙක යටතේම ගිණුම්ගත කර තිබුණි. | යන්ත්‍ර උපකරණවලින් ඉවත් කල යුතුවේ. | යන්ත්‍ර උපකරණ ගිණුම් වලින් ඉවත් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ලබාදී තිබූ ප්ලාස්ටික් බේලර් මැෂින් එකෙහි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරියේදී ලේඛනගත කිරීමට කටයුතු කරමි. |
| (v) | පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් 2017 ජූනි මස ලබාදී, තිබූ වටිනාකම රු.9,939,115 ක් වූ උපකරණ 3 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරියේදී ලේඛනගත කිරීමට කටයුතු කරමි. |
| (vi) | 2017 අවසන් මාස 03 ට අදාල උසාවි දඩ බිල් කිරීම් රු. 3,326,150 ක් 2018 වර්ෂයේ ආරම්භක හිඟ උසාවි දඩ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ආරම්භක ශේෂය ලෙස ගත යුතුවේ. | ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (vii) | සභාව භාරයේ ඇති රු.64,180 ක සේවක ඇප මුදල් අනුමැතියකින් තොරව එම ගිණුමෙන් ඉවත් කර තිබුණි. | සේවක ඇප ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි ගිණුම් සකස් කරන විට නිවැරදි කර ගන්නා බව දන්වමි. |
| (viii) | 2018 මාර්තු 19 දිනට හිඟ වෙළඳසැල් හා කඩ කුලී ආදායම රු. 69,791 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරි ගිණුම්වලින් නිවැරදි කරගන්නා බව දන්වමි. |
| (ix) | 2018 මාර්තු 19 දිනට කලින් ලද වෙළඳසැල් හා කඩ කුලී ආදායම රු. 102,332 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරි ගිණුම්වලින් නිවැරදි කරගන්නා බව දන්වමි. |
| (x) | 2018 ජනවාරි 01 සිට 2018 මාර්තු 19 දක්වා කාල පරිච්ඡේදයට අදාල හිඟ ජල ගාස්තු ආදායම රු. 39,828 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ | නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (xi) | 2018 මාර්තු 19 දිනට අදාළ වටිනාකම රු.48,222 ක් වූ ආයුර්වේද ජංගම සායන අත ඉතිරි තොග ශේෂය ගිණුම්ගත කර නොතිබුණි. | ඉතිරි තොග නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි ආයුර්වේද ජංගම සායන අත ඉතිරි තොග ශේෂ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (xii) | 2018 ජනවාරි සිට මාර්තු 19 දක්වා කාලයට අදාලව සභාවට ලැබිය යුතු උසාවි දඩ මුදල් හා එම කාලයට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | හිඟ මුදල් හඳුනාගෙන ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (xiii) | වත්කම් බදු දීමට අදාලව 2018.03.19 දිනට රු.189,532 ක කලින් ලද බදු ආදායමක් පැවතිය ද, මූල්‍ය ප්‍රකාශනවල එය රු. 3,436,939 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි ශේෂ හඳුනාගෙන ගිණුම්ගත කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | ------------------ |
| (i) | 2018 මාර්තු 19 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු වත්කම් උපලේඛනය අනුව නව නගරය පුස්තකාලය හා ඉඩමේ වටිනාකම රු.1,014,258 ක් වුවද, ස්ථාවර වත්කම් ලේඛනය අනුව ශේෂය රු.820,000 ක් වූයෙන් රු.194,258 ක වෙනසක් පැවතුණි. | නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු අතර ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව යාවත්කාලීන කළ යුතුවේ. | පිළිතුරු ලබාදී නැත. |
| (ii) | 2018 මාර්තු 19 වන දිනට වරිපනම් ලේඛනවලට අනුව වරිපනම් හිඟය රු. 13,220,791 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන අනුව එම ශේෂය රු. 14,368,750 ක් වූයෙන් රු. 1,147,959 ක නොසැසඳීමක් පැවතුණි. | නිවැරදි ශේෂ හඳුනාගෙන ගිණුම්ගත කල යුතුවේ. | නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

(ඇ) විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම.

-----------------------------------------------

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

--------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ------------------ |
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 12 කට අදාල එකතු වටිනාකම රු.644,135,459 ක් සඳහා සාක්ෂි ඉදිරිපත් කර නොතිබීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සතොෂණය කිරීමට නොහැකි විය. | වටිනාකම තහවුරු කරගැනීමට අදාල සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේදී ගිණුම් පිළියෙල කිරීමේදී ලිඛිත සාක්ෂි සහිතව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම.

----------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | --------------------- | -------------------- | ------------ | ------------------ |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහය<br>----------------------------- | | | |
| (i) | 180 සිට 184 දක්වා රීති | මුදල් හා ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන් 06 දෙනෙකු වෙතින් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගත යුතුවේ. | නිළධාරීන්ගේ ඇප තැන්පත් වැටුපෙන් අය කිරීමට කටයුතු යොදා ඇත. |
| (ii) | 203 හා 204 රීති | සභාවේ දේපළ පිළිබඳව පූර්ණ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | පූර්ණ සමීක්ෂණයක් සිදුකල යුතුවේ. | ඉදිරියේදී වත්කම් සමීක්ෂණයක් සිදුකිරීමට කටයුතු කරමි. |
| (iii) | 217 හා 218 රීති | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පී.එස්.46 ආකෘතිය ප්‍රකාර ලේඛනයක් පවත්වා නොතිබුණි. | පී.එස් 46.ලේඛනයක සියලු ඉඩම් හා ගොඩනැගිලි ඇතුලත් කල යුතුවේ. | ඉදිරියේදී පී.එස් 46 ආකෘතියක ලේඛනගත කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>----------------------- | | | |
| | මු.රෙ. 571 හා 572 | වසර 2 සිට 5 දක්වා කාලයක් ගත වී ඇති රු. 431,330 ක් වටිනා පොදු තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මු.රෙ .අනුව කටයුතු කල යුතුවේ | ඉදිරියේදී ආදායමට බැර කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | චක්‍රලේඛ හා ලිපි<br>------------------ | | | |
| | 2002 නොවැම්බර් 28 දිනැති අයිඒඅයි/2002/02 දරණ | සභාව සතු පරිගණක උපාංග හා මෘදුකාංග | | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් |

| | | |
|---|---|---|
| භාණ්ඩාගාර චක්‍රලේඛය සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | | ස්ථාවර වත්කම් ලේඛනයක් සැකසීමට කටයුතු කරමි. |

1.5 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දීර්ඝ කාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පවතින අයකිරීමට තිබෙන වැඩ සඳහා රු.2,699,837 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හඳුනාගෙන නිරවුල් කරගත යුතුවේ. | ශේෂ අය කිරීමට අදාළව හඳුනාගත හැකි ලිඛිත සාක්ෂි නොමැති බැවින් ඉදිරියේදී අනුමැතියකින් පසුව ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කරමි. |

1.6 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණ කරවා ගතයුතු රු 1,715,018 .ක් වූ හිඟ වැටුප් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණි. | ලිඛිත අනුමැතිය ලබාගත යුතුවේ. | අනුමැතිය පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇති අතර ලැබුණු පසුව විගණනයට ඉදිරිපත් කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන අනුව 2018 ජනවාරි 01දින සිට 2018 මාර්තු 19 දින දක්වා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 1,970,324 ක් වී තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉඩම් ගොඩනැගිලි අයිතම 22 ක හා මෝටර් රථ හා කරත්ත අයිතම 09 ක මුළු එකතු වටිනාකම රු. 75,920,613 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2018 මාර්තු 19 දින වන විට වසර 01 සිට 07 දක්වා කාලයක සිට අයනොවී පවතින සේවක ණය හිඟ ශේෂය රු. 166,265 ක මුදල අදාල නිලධාරියාගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ නිළධාරින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | අය කිරීමට කටයුතු යොදා ඇත. |
| (ආ) | වසර 05 ක පමණ කාලයක සිට අක්‍රීයව පවතින බැංකු ගිණුම් 03 ක එකතුව රු. 1,034,995 ක මුදල් ඵලදායි උපයෝජනයට අවධානය යොමුකර නොතිබුණි. | ඵලදායි ලෙස උපයෝජනය කල යුතුවේ. | අක්‍රීයව පවතින බැංකු ගිණුම් වසා දැමීමට පළාත් පාලන කොමසාරිස්ගෙන් අනුමැතිය ඉල්ලා ඇත. |

3.3 නිෂ්ක්‍රීය/ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ දී ලබා දී තිබූ රු.4,830,000 ක් වටිනා Magic BIO KUN – TECH – 550- A1 යන්ත්‍රය2019 ජනවාරි 11 දින වන විට වර්ෂයකට අධික කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | ඵලදායි ලෙස උපයෝජනය කල යුතුවේ. | මෙම යන්ත්‍රය උත්පාදිත ආදායමට වඩා වියදම අධික වීම මත තාවකාලිකව භාවිතයෙන් ඉවත්කර ඇත. |

3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

----------------------------

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | ------------- | ------------------ |
| (අ) | තමන්කඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග 06 ක් සංවර්ධනය කිරීම සඳහා සභාපතිවරයා හා කේ්ර්එස් ඉංජිනියර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය අතර 2010 අගෝස්තු 02 දින අත්සන් කරන ලද රු. 53,107,118 ක් වටිනාකම වූ ගිවිසුම ප්‍රකාරව අදාල ආයතනය වෙත ගෙවීම් කරන ලද අත්තිකාරම් මුදලින් රු. 6,546,030 ක මුදලක් 2013 ජූනි 28 දින ලැබුණු නඩු තීන්දුව අනුව නිරවුල් කර ගැනීමට හැකියාව තිබුණු නමුත් සභාවේ හා අදාල බැංකුවේ ප්‍රමාදය හේතුවෙන් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් බැංකුවට විරුද්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, මු.රෙ. 104 යටතේ පරීක්ෂණ පවත්වා ඉදිරියේදී එවැනි ගැටළු ඇති නොවීමට ක්‍රියාත්මක කල යුතු අභ්‍යන්තර පාලන ක්‍රමවේද ඇති කිරීම සඳහා ද කටයුතු කර නොතිබුණි. | පරික්ෂණ පවත්වා වගකිව යුත්තන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුඅතර නැවත මෙවැනි අඩුපාඩු නොවීම සඳහා අවශ්‍ය පාලන පිලිවෙත් ඇති කළ යුතුවේ. | ඉදිරියේදී පිළිතුරු ලබාදීමට කටයුතු කරමි. |
| (ආ) | ඉහත (අ) ඡේදය යටතේ අසාර්ථක වූ ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවාව ලබාදුන් උපදේශන ආයතනය සමඟ පොළොන්නරුව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා රු. 16,500,000 ක් වටිනා ගිවිසුමක් 2012 ඔක්තෝබර් 10 දින ඇති කරගෙන තිබූ අතර, මෙම උපදේශන ආයතනයද ගිවිසුම් ප්‍රකාරව සේවය ලබානොදී ව්‍යාපෘතියෙන් ඉවත් වී තිබුණු නමුත් ඊට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගිවිසුම් කඩ කිරීම සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරියේදී පිළිතුරු ලබාදීමට කටයුතු කරමි. |
| (ඇ) | පොළොන්නරුව වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ විදුලි, දොර ජනෙල් ඇතුළු සියලුම සැලසුම්පත් ලබාගැනීමකින් තොරව, මුල් අදියර සඳහා නියමිත උපදේශන සේවා ගාස්තුව වූ සියයට 30 ක මුදල ඉක්මවා ගාස්තුවෙන් සියයට 40 ක් වූ රු. 6,600,000 ක් 2012 හා 2013 වර්ෂවලදී උපදේශන ආයතනයට ගෙවීම් කර තිබුණි. | නීති ,රීති උල්ලංඝනය කිරීම සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරියේදී පිළිතුරු ලබාදීමට කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------
අභ්‍යන්තර විගණනය
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකල යුතුවේ. | අභ්‍යන්තර නිළධාරියෙකු පත්කර ඇතත් විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. |